# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 24 දරන
# භගවාන් ශ්‍රී සත්‍ය සායි සේවා සමිති භාරය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 අප්‍රේල් මස 03 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : ශත 60 යි.　　　　තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1992 අංක 24 දරන භගවාන් ශ්‍රී සත්‍ය සායි සේවා සමිති භාරය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 31 වන දින]

එල්. ඩී.—ඔ. 92/90.

## භගවාන් ශ්‍රී සත්‍ය සායි සේවා සමිති භාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"භගවාන් ශ්‍රී සත්‍ය සායි සේවා සමිති භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන භාරයක් එම භාරයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ භාරයට සම්බන්ධ සියලු පරමාර්ථ සහ කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් කොළඹ පිහිටුවා තිබුණු හෙයින් ද: පූර්විකාව.

ඒ භාරය පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ සහ කරුණු සඳහාද ඒ පරමාර්ථ සහ කරුණු ඒ භාරය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර ඇති හෙයින් සහ ඉටු කර ඇති හෙයින් ද, ඒ භාරය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින්ද, එම ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1992 අංක 24 දරන භගවාන් ශ්‍රී සත්‍ය සායි සේවා සමිති භාරය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඩු නාමය.

2. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන්පසු (මෙහි මින්මතු "භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) භගවාන් ශ්‍රී සත්‍ය සායි සේවා සමිති භාරයේ භාරකාර මණ්ඩලයෙහි දැනට සාමාජිකයන් වී සිටින තාක් තැනැත්තන් ද මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින්මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයන්ද "භගවාන් ශ්‍රී සත්‍ය සායි සේවා සමිති භාරය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන අතර පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේය. තවද එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඒ සංස්ථාවට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි ය. භගවාන් ශ්‍රී සත්‍ය සායි සේවා සමිති භාරය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කිරීමට අරමුණු කොටගත් පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතුයයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(i) භගවාන් ශ්‍රී සත්‍ය සායි බාබා තුමාගේ පණිවුඩය බෙදාහැරීම සහ ඉගැන්වීම් පතුරුවාලීම;

(ii) සත්‍ය, ධර්ම, ශාන්ති සහ ප්‍රේම යන මේ මූලික මූලධර්ම පිළිපැදීමෙන් හා ආදර්ශයෙන් පතුරුවා හැරීම;

(iii) වේද, උපනිෂද්, ශාස්ත්‍ර හා පුරාණ පිළිබඳ දැනුම පතුරුවාලීම ;

(iv) සියලු ආගම්වල ආචාර ධර්මීය මූල ධර්ම පිළිබඳ අධ්‍යයනය ප්‍රවර්ධනය කිරීම ;

(v) ආගම් අතර අන්‍යෝන්‍ය එකමුතුව ප්‍රවර්ධනය කිරීම ;

(vi) මනුෂ්‍ය වර්ගයා අතර සාමය සහ සුහදතාව ප්‍රවර්ධනය කිරීම ;

(vii) ඕනෑම පාසලක, විද්‍යාලයක, විශ්ව විද්‍යාලයක හෝ වෙනත් විද්‍යායතනයක අධ්‍යයනය හැදෑරීමට අදහස් කරන සුදුසු ශිෂ්‍යයනට ශිෂ්‍යත්ව ලබාදීම ;

(viii) අධ්‍යාපනය, සමාජ ශුභ සිද්ධිය සහ පුනරුත්ථාපනය නංවාලීමට තුඩුදෙන පන්ති, දේශන, සම්මේලන සහ අධ්‍යයන චාරිකා පැවැත්වීම සහ ඊට අදාළ වෙනත් කටයුතුවල නිරතවීම ;

(ix) දිළිඳු, මහලු සහ ආබාධිත අයට සහ අනාථ ළමයිනට නිවාස සැපයීම ;

(x) ආපදාවන්ට පත්ව සිටින පුද්ගලයන්ට ආහාර සලාක, කෑම සහ වෙනත් ආධාර සැපයීම ;

(xi) රෝගී පුද්ගලයන්ට ප්‍රතිකාර කිරීම සඳහා ආරෝග්‍යශාලා සහ ශායන සැපයීම ; සහ

(xii) සංස්ථාවේ පරමාර්ථ සපුරා ගැනීමට අවශ්‍ය වන හෝ ඉවහල් වන ආකාරයේ වෙනස් සියලු දේ කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇත්තා වූ ද එකී රීතිවලට අනුකූලව තෝරා ගනු ලබන්නා වූ ද සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත වූ භාරකාර මණ්ඩලයක් විසින් ඒ රීතිවලට යටත්ව කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේදී භාරයේ භාරකාර මණ්ඩලය වශයෙන් ධුර දැරුවා වූ ද මෙහි උපලේඛනයේ නිශ්චිතව නම් සඳහන් කර ඇත්තා වූ ද භාරකාර මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

5. මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන දේ සඳහා බලතල සංස්ථාවට ඇත්තේ ය :—

(අ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම සහ එකතු කිරීම ;

(ආ) චංචල හෝ නිශ්චල යම් දේපළක් කවර වුව ද ආකාරයකින් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීම ;

(ඇ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ප්‍රදානයන්, පරිත්‍යාග හෝ ණය දීම ;

(ඈ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයේ යෙදීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය පැවැත්වීම ;

(ඉ) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරි කිරීමේ සහ තැන්පතු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වැසීම සහ ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ;

(ඊ) සංස්ථාවේ අරමුදල් භාරකාර මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සුරැකුම්පත්වල ආයෝජනය කිරීම ; සහ

(උ) මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම.

මණ්ඩලයේ රීති.

6. (1) සංස්ථාව විසින් මෙහි පහත සඳහන් වන සියලු කාර්යයන් හෝ ඉන් යම් කාර්යයක් සඳහා කලින් කළ සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමකදී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන්, මේ පනතේ හෝ වෙනත් කිසියම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේය :—

(අ) භාරකාර මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය, ඒ සාමාජිකයන් සිය නිලයෙන් ඉල්ලා අස්වීම හෝ නිලය හැරයාම සහ සාමාජිකයන්ගේ පුරප්පාඩු පිරවීම සහ එවැනි සාමාජිකයන් තෝරාපත් කිරීම ;

(ආ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි ඇතුළුව ඔවුන්ගේ බලතල, හැසිරීම, කාර්යයන් සහ කර්තව්‍යයන් ;

(ඇ) භාරකාර මණ්ඩලයේ රැස්වීම් කැඳවීමේ සහ පැවැත්වීමේදී පිළිපැදිය යුතු කාර්ය පරිපාටිය, එබඳු රැස්වීම් පැවැත්වෙන වේලාවන්, ස්ථාන, ඒ පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, ඒ රැස්වීම් සඳහා අවශ්‍ය ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම ;

(ඈ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, එහි අරමුදල්වල භාරකාරත්වය සහ එහි ගිණුම් පවත්වා ගෙන යාම සහ විගණනය කිරීම ;

(ඉ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ ඕනෑම රීතියක් සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම, (1) උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයටම, කළ හැකි වන්නේ ය.

සංස්ථාවෙන් ගෙවිය යුතු හා සංස්ථාවට අය විය යුතු ණය.

7. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි දී පැවති භාරයේ සියලුම ණය සහ බැරකම්, සංස්ථාව විසින් ගෙවා නිමකළ යුතු අතර එදිනට භාරයට අය විය යුතු සියලු ණය සහ ඊට ගෙවිය යුතු දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුත්තේ ය.

සංස්ථාවේ මුද්‍රාව.

8. සංස්ථාවේ මුද්‍රාව—

(අ) මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තකුගේ ආරක්ෂා භාරයෙහි තැබිය යුත්තේ ය;

(ආ) භාරකාර මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකිය; සහ

(ඇ) භාරකාර මණ්ඩලයේ අවසරය ඇතිව සහ යටත් පිරිසෙයින් භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිටදී මිස කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු ය. එකී සාමාජිකයන් දෙදෙනා විසින් තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි නම නම අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුත්තේ ය.

ජනරජයේ සහ අන්‍යයන් ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

9. මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනයම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

10. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

උපලේඛනය (වගන්තිය 4(2))

1. ගරු විනිශ්චයකාර ආනන්ද ද සිල්වා මැතිතුමා (සභාපති)
2. දොස්තර එන්. සභාසිවම්
3. ජී. ඩී. සිරිසේන
4. එස්. වේලායුදපිල්ලෙයි
5. එම්. වන්නියගේ කරම්
6. කේ. සුන්දරාභරණ
7. ජී. කේ. හේමරත්නම්.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. විදේශීය රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.